**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

***වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය***

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

2016 ජනවාරි/ පෙබරවාරි

**BMGT E 1065/ BMGT 13065 – තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

**මෙම ප්‍රශ්න පත්‍රය "අ", "ආ" සහ "ඇ" යනුවෙන් කොටස් තුනකින් සමන්විතය.**
**"අ" සහ "ආ" කොටසේ සියළුම ප්‍රශ්න අනිවාර්යය. "ඇ" කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සැපයිය යුතුය.**

**"අ" කොටස**

(01) මෙම 'අ' කොටසෙහි එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම නිවැරදි පිළිතුරු තෝරා ඒ යටින් ඉරක් අඳින්න. වෙනත් කඩදාසිවල සපයනු ලබන පිළිතුරු භාරගැනීම හෝ ලකුණුදීම කරනු නොලැබේ.

(i) තොරතුරු යනු,

අ) දත්ත වේ.
ආ) සකසන ලද දත්ත වේ.
ඇ) වෙනස් කරන ලද ආදානයන් වේ.
ඈ) පරිගණක ප්‍රතිදානයන් වේ.
ඉ) ඉහත කිසිවක් නොවේ.

(ii) උපක්‍රමික තොරතුරු අවශ්‍ය වන්නේ,

අ) මැදපෙළ කළමනාකරුවන්ටය.
ආ) මෙහෙයුම් කළමනාකරුවන්ටය.
ඇ) ඉහල කළමනාකරුවන්ටය.
ඈ) සියලු සේවකයන්ටය.
ඉ) සැපයුම්කරුවන්ටය.

(iii) මෝටර් කාර් නිෂ්පාදනයේ දී උපක්‍රමික මට්ටමේ තොරතුරු වර්ගයක් අවශ්‍ය වන්නේ,

අ) නව මාදිලියක් හඳුන්වාදීමේ තීරණ ගැනීමට.

ආ) නිෂ්පාදනය සැලසුම් කිරීමට.

ඇ) තරඟකරුවකුගේ මෝටර් රථයක් අධ්‍යනය කිරීමට.

ඈ) එකතු කරන ලද විකුණුම් බදු ආගනනයට.

ඉ) ඉහත සියල්ලටම.

(iv) කළමනාකරණ තොරතුරු පද්ධතියක්,

අ) එදිනෙදා කාර්යාල කටයුතුවලට උපකාරී වන ලේඛන සකස්කිරීම හා හුවමාරුව සිදුකරයි.

ආ) ව්‍යාපාර ගනුදෙනු සකස් කිරිම සිදුකරයි.

ඇ) විශේෂඥ ගැටළු විසඳන්නෙකුගේ දැනුම අත්පත් කරගැනීම හා නැවත නිපදවීම සිදුකරයි.

ඈ) ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා කළමනාකරුවන්ට අවශ්‍ය තොරතුරු ගනුදෙනු දත්ත ඇසුරින් නිපදවාලයි.

ඉ) ඉහත කිසිවක් නොවේ.

(v) විශ්ව විද්‍යාලය විසින් දේශකවරුන්ට සිසුන්ගේ විභාග ප්‍රතිඵල අධ්‍යයනය හා සිසුන්ට උපදෙස්දීම යන කාර්යයන් සිදුකල හැකි ජාලගත තොරතුරු පද්ධතියක් ඇති කරයි. නම් එය,

අ) CRM

ආ) Intranet

ඇ) ERP

ඈ) Extranet

ඉ) ඉහත කිසිවක් නොවේ.

(vi) විධායක කළමනාකරුවන්ගේ සැලසුම් කිරීම හා ඇගයීමේ අවශ්‍යතා සඳහා උපකාරීවන තොරතුරු පද්ධතිය වනුයේ,

අ) තීරණ ආධාරක පද්ධතිය.

ආ) ගණුදෙනු සැකසුම් පද්ධතිය.

ඇ) ERP එකක්

ඈ) කළමනාකරණ තොරතුරු පද්ධතිය.

ඉ) ඉහත කිසිවක් නොවේ.

(vii) නූතන තොරතුරු පද්ධතීන් ගණුදෙනුකරුවන් හා සැලයුම්කරුවන් අතර අතුරු මුහුණතක් ගොඩනැගීම හඳුන්වනු ලබන්නේ,

- අ) ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිඉංජිනේරුකරණ ලෙසයි.
- ආ) පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ ලෙසයි.
- ඇ) සැපයුම්දාම කළමනාකරණ ලෙසයි.
- ඈ) "අ" සහ "ආ" යන දෙකම ලෙසයි.
- ඉ) "ආ" සහ "ඇ" යන දෙකම ලෙසයි.

(viii) පහත ඒවා අතුරින් තොරතුරු පද්ධති යෙදවුමක් <u>නොවන්නේ</u>,

- අ) දත්ත සමුදාය කළමනාකරණ පද්ධති
- ආ) තීරණ ආධාරක පද්ධති
- ඇ) විශේෂඥ තොරතුරු පද්ධති
- ඈ) කළමනාකරණ තොරතුරු පද්ධති
- ඉ) කාර්යාල ස්වයංකරණ පද්ධති

(ix) පහත ප්‍රකාශයේ ඇති හිස් තැන පිරවීම සඳහා වඩාත්ම සුදුසු පදය තෝරන්න.
............................ ජාලයක් ගත් කල එහි යෙදවුම් සැකසීමේ ක්‍රියාවලිය සේවාදායකයන් (clients) හා සේවා සපයන්නන් (servers) එකක් හෝ කීප දෙනෙක් අතර බෙදී පවතියි.

- අ) Client-Server ආගනණ
- ආ) වලාකුළු ආගනණ
- ඇ) ජංගම ආගනණ
- ඈ) දත්ත ආගනණ
- ඉ) ඉහත කිසිවක් නොවේ.

(x) දත්ත කැනීම (Data mining) යොදාගනු ලබන්නේ,

- අ) මෙහෙයුම් කළමනාකරණ කටයුතු වලටය.
- ආ) කළමනාකරුවන් විසින් අතීතයේ ගත් තීරණ විශ්ලේෂණයටය.
- ඇ) මෙහෙයුම් දත්තවල රටාවන් හඳුනාගැනීමටය.
- ඈ) පැරණි දත්ත නැවත ලබාගැනීමටය.
- ඉ) උපක්‍රමික කළමනාකරණයට උදව්වීමටය.

(එකකට ලකුණු 2.5 බැගින්)

(මුළු ලකුණු 25)

## "ආ" කොටස

මෙම කොටසට පිළිතුරු සැපයීමට වෙනම කඩදාසි භාවිතා කරන්න.

(02) අ) පරිගණකයක ප්‍රධාන උපාංග මොනවාද?

(ලකුණු 05)

ආ) සසම්භාවී ප්‍රවේශ මතකයේ භූමිකාව කුමක්ද?

(ලකුණු 05)

ඇ) ද්විතියික ආචයනය යනු කුමක්ද? ද්විතියික ආචයන මෙවලම් දෙකක් නම් කරන්න.

(ලකුණු 03)

ඇ) දත්ත ගබඩා කිරීම සඳහා යොදාගත හැකි භෞතික නොවන භාහිර ගබඩාකරණ විකල්ප දෙකක් නම් කරන්න.

(ලකුණු 03)

ඉ) වලාකුළු ආගන වර්ග තුන නම් කරන්න.

(ලකුණු 03)

(මුළු ලකුණු 15)

## "ඇ" කොටස

මෙම කොටසට පිළිතුරු සැපයීමට වෙනම කඩදාසි භාවිතා කරන්න. කැමති ප්‍රශ්න තුනක් (03) පමණක් තෝරාගන්න.

(03) අ) අන්තර්ජාලය ක්‍රියාකරන්නේ කෙසේද? රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

අ) පරිශීලක - පරිශීලක ආගණනය (Peer to Peer computing) යනු කුමක්ද? එය සේවාදායක - සේවායෝජන ආගණනයෙන් (Client server computing) වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 07)

ඇ) Face book යනු පරිශිලකයන් හට ඡායාරූප, අදහස්, කැමැත්ත ප්‍රකාශ කල හැකි සමාජ ජාලයකි. අන්තර්ජාලය තුල පවතින තවත් මෙවැනි සමාජ මාධ්‍ය 4 ක් හඳුනාගෙන ඒවායේ ස්වභාවය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

(04) අ) පද්ධති මෘදුකාංග යනු කුමක්ද යන්න ඒවායේ කාර්යභාරය උකහා දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) පරිගණක පද්ධතියකට ඇතිවිය හැකි ප්‍රධාන තර්ජන මොනවාද?

(ලකුණු 05)

ඇ) වයිරස් ගාඩ්වල (Virus guards) හා අන්තර්ජාල ආරක්ෂක පද්ධතිවල (Internet security systems) කාර්යභාරය කුමක්ද?

(ලකුණු 05)

ඈ) පරිගණක පද්ධතියක ආරක්ෂාව පිණිස පැවතිය යුතු භෞතික ආරක්ෂක විධාන කවරේද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

(05) අ) වළාකුළු ආගණනය (Cloud computing) යනුවෙන් ඔබ කුමක් අදහස් කරන්නේද?

(ලකුණු 05)

ආ) සේවාවක් ලෙස මෘදුකාංග (Saas) යනුවෙන් ඔබ කුමක් අදහස් කරන්නේද? පවතින එවැනි සේවාවලට නිදසුන් සපයන්න.

(ලකුණු 07)

ඇ) පරිගණක තුල පරිගණකවල යෙදවුම් මෘදුකාංග ස්ථාපනය කොට භාවිත කරනවාට වඩා වළාකුළුගත යෙදවුම් මෘදුකාංග භාවිතයෙන් ලැබෙන ප්‍රතිලාභ හා ඇතිවිය හැකි අවධානම් මොනවාද?

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

(06) අ) DBMS යනුවෙන් ඔබ කුමක් අදහස් කරන්නේද? එවැන්නක් පවත්වාගෙන යාමේ පරමාර්ථය කුමක්ද?

(ලකුණු 05)

ආ) Big Data යනු කුමක්ද? නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) දත්ත ගබඩාවක් (Data warehouse) යනුවෙන් කුමක් අදහස්වේද? එවැන්නක් පවත්වාගෙන යාමේ අරමුණ කුමක්ද?

(ලකුණු 05)

ඈ) දත්ත තැනීම (Data mining) යනු කුමක්ද? නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)